මගේ අංකය / எனது இல / My No: DSD/HO/09/CBO/03/ලි.ප.අළුත්/1

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2025.11.28

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්,

ප්‍රජාමූල විෂයභාර දිස්ත්‍රික් කළමණාකරුවන්,

සියළු බැංකු සමිති කළමණාකරුවන් වෙත.

**<u>සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීම හා ලියාපදිංචිය අළුත් කිරීම - 2026</u>**

උක්ත කරුණ සම්බන්ධව ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක “ප්‍රජාමූල /02/2017/02” සහ “2018/06ප්‍රජාමූල 07/2018/02” සහ “එකතු කිරීම් 2019/01” යන චක්‍රලේඛ අනුකූල කර ගනිමින් 2026 වර්ෂයට සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීම සහ ලියාපදිංචි අළුත්කිරීමට අදාල කටයුතු 2017 මාර්තු 07 වන ගැසට් පත්‍රයේ 04 -11 අනුව නිශ්චිත කාලයක් තුල සිදු කල යුතු බව කාරුණිකව දන්වමි.

02. චක්‍රලේඛ උපදෙස් අනුව හා ව්‍යවස්ථානුකූලව සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම 2026 ජනවාරි 01 සිට 2026 පෙබරවාරි 15 දිනට ප්‍රථම පැවැත්විය යුතු වේ. සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම (නිලවරණය) 2026 පෙබරවාරි 15 සිට 2026 මාර්තු 31 දිනට ප්‍රථම පැවැත්විය යුතු අතර වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා දින 30 ක් ඇතුලත ලියාපදිංචිය අළුත් කිරීමට පියවර ගත යුතුවේ. අදාල අකෘති පත්‍ර මේ සමඟ ඉදිරිපත් කරමි. නිලවරණ පැවැත්වීමේදී ප්‍රජාමූල හා ප්‍රාදේශීය සංවිධානයන්ට ප්‍රචාරණයක් ලැබෙන පරිදි ඒ සඳහා වන දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම මඟින් කටයුතු කළ යුතුය. මෙම රැස්වීමේදී 2025 වර්ෂයේ අරමුදල් පදනම් කරගෙන 2026 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර එය සම්මත කර ගතයුතුය. එය ප්‍රාදේශීය ලේකම් මඟින් දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

03. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කිරීම සඳහා වන ලියාපදිංචි ගාස්තු මෙම වර්ෂයේද ***සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලට*** යොමු කළ යුතු අතර ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්නේ නම් මැනවි. චෙක්පත් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම වැලැක්වීමට සියළු පාර්ශවයන් දැනුවත් කරන මෙන් දන්වමි.

04. **සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වාර්ෂික ලියාපදිංචිය අළුත් කිරීම**

a. ප්‍රජාමූල සංවිධාන වාර්ෂික ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු ලෙස රු. 300/- ක ගාස්තුවක් ගෙවිය යුතු වේ. මෙම මුදල් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ තැන්පත් කර, මුදල් තැන්පත් කළ රිසිට්පත සමඟ පහත ලේඛන ලියාපදිංචිය අළුත් කිරීම සඳහා 2026 මාර්තු 15 දිනට පෙර ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු වෙත යොමු කළ යුතුය. වාර්ෂික මහ සභාව පවත්වා ලිත් මසක් ඇතුලත ලියාපදිංචි කිරීම සඳහා යොමු කිරීම අනිවාර්යයෙන් කළ යුතු අතර එසේ නොකරන ප්‍රජාමූල සංවිධාන වෙතින් රු 200/-ක ප්‍රමාද ගාස්තුවක් අයකරගත යුතුය. මෙම ප්‍රමාද ගාස්තුව ප්‍රාදේශීය සංවිධානයේ ආදායමක් ලෙස ගැනීමට කටයුතු කළ යුතුවේ.

i. ලියාපදිංචිය අළුත්කිරීමේ අයදුම්පත පිටපත් දෙකක්, (ඇමුණුම් අංක CBO/C.7/01)
ii. වාර්ෂික මහසභා රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපතක්,
iii. WhatsApp හෝ දුරකථන අංක සහිතව නව සාමාජිකයින්ගේ නාම ලේඛනය.
iv. 2025 වර්ෂයේ ආදායම් වියදම් වාර්තාවේ සහතික කළ පිටපතක්
v. විධායක සභාවේ කටයුතු කිරීමට කැමැත්ත ප්‍රකාශ කරමින් නව විධායක සභාවට පත්වූ සාමාජිකයින්ගේ නාම ලේඛනය ( ඇමුණුම් අංක (CBO/C.7/:02)

ලියාපදිංචිය අළුත් කිරීමෙන් පසු සියළු ලේඛන ප්‍රජාමූල බැංකු සමිතියේ සුරක්ෂිතව තබාගත යුතු අතර ලියාපදිංචිය අළුත්කිරීම සඳහා වන සහතිකය ප්‍රජාමූල සමිති කළමණාකරු විසින් ප්‍රජාමූල සංවිධාන වෙත නිකුත් කල යුතුවේ. ( ඇමුණුම් අංක (CBO/C.7/:06) මුදල් ගෙවන ලද ප්‍රජාමූල සංවිධානවල නාම ලේඛනයක් ප්‍රජාමූල සංවිධාන අංශයට එවීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත අනිවාර්යයෙන් යැවිය යුතුය.

05. **ප්‍රාදේශීය සංවිධාන වාර්ෂික ලියාපදිංචිය අළුත් කිරීම**

a. ප්‍රාදේශීය සංවිධාන වාර්ෂික ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු ලෙස රු. 300/- ක ගාස්තුවක් ගෙවිය යුතු වේ. මෙම මුදල සමඟ ප්‍රාදේශීය සංවිධානයට අයත් සියළු ප්‍රජාමූල සංවිධාන ලියාපදිංචිය අළුත් කිරීම සඳහා වන ගාස්තු ගිණුම් අංක ***0080012772 දරණ සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල***, නමින් ලියන ලද චෙක්පතක් මගින් පමණක් ප්‍රජාමූල සංවිධාන නාමලේඛනය ද සමඟ සෘජුවම අධ්‍යක්ෂ ප්‍රජාමූල සංවිධාන අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉහත ගිණුමට ප්‍රජාමූල බැංකු සමිති වෙතින් කිසිසේත්ම මුදල් බැර කිරීම නොකරන මෙන් දන්වමි. සැ.යු සියළුම ප්‍රජාමූල සංවිධානවල ලියාපදිංචි ගාස්තු එකතුකර චෙක්පතක් එවීමට කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කරන මෙන් දන්වන අතර ප්‍රජාමූල සංවිධාන වෙන වෙනම චෙක්පත් එවීම නොකරන්නේනම් මැනවි.

b. ප්‍රාදේශීය සංවිධානය මුදල් ගෙවූ බවට තහවුරු ලේඛනයක පිටපතක් සමඟ පහත ලේඛන දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ලියාපදිංචි අළුත්කිරීමේ අයදුම්පතේ පිටපත් දෙකක්,
ii. වාර්ෂික මහසභා රැස්වීම් වාර්තාවේ සහතික කල පිටපතක්,
iii. WhatsApp අංක සහිතව නව විධායක සභාවේ සාමාජිකයින්ගේ නාම ලේඛණය.
iv. වාර්ෂික මහසභා රැස්වීමට සහභාගි වූ සාමාජිකයින්ගේ නාම ලේඛණය
v. ආදායම් වියදම් වාර්තාවේ සහතික කල පිටපතක්
vi. විධායක සභාවේ කටයුතු කිරීමට කැමැත්ත ප්‍රකාශ කරමින් නව විධායක සභාවට පත්වූ සාමාජිකයින්ගේ නාම ලේඛනය ( ඇමුණුම් අංක (CBO/C.7/:08)

c. <u>දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයෙන් ප්‍රජාමූල සංවිධාන අංශය වෙත එවිය යුතු ලේඛන.</u>

i. ඉහත ලේඛන සියල්ල පරීක්ෂා කර බලා නිවැරදි බවට තහවුරු කර සනාථකර ගැනීමෙන් පසු අත්සන යෙදූ මේ සමඟ ඉදිරිපත් කරන එම පිරික්සුම් ලේඛනය. (ඇමුණුම් අංක 01)

ii. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ නිර්දේශ සහිතව අයදුම් පත්‍රයේ පිටපත් දෙක.

iii. ප්‍රජාමූල හා ප්‍රාදේශීය සංවිධාන වෙතින් මුදල් ගෙවූ බවට තහවුරු ලේඛනයක් හා අදාල ප්‍රජාමූල සංවිධාන නාම ලේඛනය.

<u>සටහන</u> :- ප්‍රජාමූල බැංකු සමිතියෙන් එවන ලද අනෙකුත් ලේඛන සියල්ල දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ ගොණුකර සුරක්ෂිතව තබාගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

06. අළුතින් ලියාපදිංචි කරන ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන සහතිකයක් නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල හා ක්‍රීඩා අංශය වෙත එවිය යතුය.

07. ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා (2024 වර්ෂයේ හඳුන්වා දුන් නව ආකෘති පත්‍රය)ඇමුණුම අංක ( CBO/c.7/:04) පමණක් භාවිතා කරන මෙන් දන්වමි. ඔබ ඉදිරිපත් කරන අයදුම් පත්‍රයේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ නිර්දේශය තිබිය යුතුය.

08. 2026 පෙබරවාරි 15 සිට මාර්තු 30 දක්වා වාර්ෂික මහ සභා රැස්වීම පවත්වා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 2026 වර්ෂයට ලියාපදිංචිය අළුත් කිරීමට කටයුතු කළ යුතුය. ලියාපදිංචි කිරීමේ ගාස්තු අංක 0080012772 දරන සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල නමින් ලියන ලද චෙක්පත් අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රජාමූල සංවිධාන අංශයට ලැබීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

09. මෙම වර්ෂයේ අත්දැකීම් අනුව ඇතැම් දිස්ත්‍රික්ක දෙවන කාර්තුව වන තෙක් ලියාපදිංචිය පිළිබඳ විස්තර අපවෙත එවීමට කටයුතු කර නොතිබූ හෙයින් තොරතුරු නිවැරදිව යාවත්කාලීන කිරීමට නොහැකිව අපහසුතාවයකට ලක්වූ හෙයින් මෙම කාර්යය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම වසමේ සංවර්ධන නිලධාරීගේ, බැංකු කළමණාකරුගේ ,සමිති කළමණාකරුගේ හා <u>දිස්ත්‍රික් ප්‍රජාමූල විෂය භාර කළමණාකරුගේ</u> වගකීමක් වේ. ඒ පිළිබඳ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

ඉහත කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළුව කාර්යය මණ්ඩලයෙන් ලැබෙන කාරුණික සහාය ඉතා අගය කොට සලකමි.

සී.ඩී කළුආරච්චි.
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

01. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
02. ප්‍රධාන ගණකාධිකාරී - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
04. සියළුම අධ්‍යක්ෂවරුන් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
05. ගරු. සභාපති - ප්‍රජාමූල /ප්‍රාදේශීය සංවිධානය - කා.දැ.ස.